# දේශගුණ විපර්යාස වලින් බැට කන මහවැලි ගංගා ද්‍රෝණි වැසියෝ......

**වත්සලා තිරාණගමගේ**

**සංවර්ධන නිලධාරි, දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය**

**පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය**

ශ්‍රී ලංකාව සතුව ගංගාවන් 103 ක් ගලා බසින අතර ඉන් දිගම ගංගාව වන්නේ මහවැලි ගංගාවයි. එසේම වර්ග කිලෝමීටර 10,000 පමණ වන විශාලතම දිය බැස යන ප්‍රදේශය අයත් වන්නේ මහවැලි ගංගා ද්‍රෝණියටයි. දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් හයෙන් එකකට වැඩියෙන් එයට අයත්ය. එය අතු ගංගා 38කින් පෝෂණය වේ. මිලි මීටර 4000-5000ක වාර්ෂික වර්ෂාපතනයක් ලැබෙන මහවැලි ගඟ වියලි කලාපයේ වාරිමාර්ග පද්ධතියේ ප්‍රධාන ජල මුලාශ්‍රය වේ. මෙම ගංගා ද්‍රෝණියට පළාත් 4ක් සහ දිස්ත්‍රික්ක හයක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40ක් අයත්ය. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ විශාලතම බහුකාර්ය ව්‍යාපෘතිය වූ මහවැලි යෝජනා ක්‍රමයද මහවැලි ගඟ මුල් කොටගෙන ආරම්භ විය. මෙමගින් ජල විදුලි බලය නිෂ්පාදනය හා වාරිමාර්ග පහසුකම් ලැබේ. කෙසේ වෙතත්, මහවැලි යෝජනා ක්‍රමයේ සංවර්ධන ප්‍රතිලාභ ගංගා ද්‍රෝණියේ විශාල ප්‍රදේශයකට ලැබී නොමැත.






මහවැලි ද්‍රෝණි ආශ්‍රිතව සිදුවන නායයාම්, නියං හා ගංවතුර වැනි ස්වාභාවික විපත්වල ඉහළ යාම දේශගුණ විපර්යාසයන්හි අහිතකර බලපෑම් නිසා සිදු වන බව තහවුරු වී ඇත. මේ නිසා භූමි හායනය ඉහළ ගොස් කෘෂිකාර්මික ඵලදායීතාවය අඩු වී ඇත. මෙම ගැටළු කෙරෙහි උෂ්ණත්වය හා වර්ෂාපතන විචල්‍යතාවයන් හේතු වී ඇත. මහවැලි ගංගා ද්‍රෝණියේ දේශගුණ අවදානම ඉහළ යාමට වඩාත් බලපා ඇත්තේ වර්ෂාපතන විචල්‍යතාවයයි. මහවැලි ද්‍රෝණිය ආශ්‍රිත වර්ෂාපතන රටාවන්හි විචල්‍යතාවයන් මැදි හා පහළ ජල පෝෂකයන්හි දැක ගත හැක. මෙම ප්‍රදේශ වල ප්‍රධාන වර්ෂාපතනය දෙවැනි අන්තර් මෝසම සමඟ ආරම්භ වී ඊසානදිග මෝසම පුරා පවතී. මෙම වර්ෂාපතන විචල්‍යතාවයන් සැලකියයුතු ලෙස ඉහල ගොස් ඇත. මෙමගින් අදහස් වෙන්නේ වර්ෂාපතනය මත යැපෙමින් ගොවීන් වගා කටයුතු කිරීම තවදුරටත් වලංගු නොවන බවයි. යම් නිශ්චිත ඍතුවක පවා වර්ෂාපතන ව්‍යාප්තියෙහි සැලකිය යුතු විචල්‍යතාවයන් පවතී. එනම්, වර්ෂාපතනය පමා වීම, අධික වර්ෂාපතයක් ඇතිවීම, දීර්ඝ නියං කාලයන් ඇති වීම සහ දිගු වියලි කාලයන්ට පසුව අධික වර්ෂාපතනයක් ඇති වීම දැන් දැන් සාමාන්‍ය තත්ත්වයක් බවට පත් වෙමින් පවතී. එවන් වර්ෂාපතන විචල්‍යතාවයන් හානිකර වන්නේ වර්ෂා ජලයෙන් හා සුළු වාරිමාර්ග වලින් වගා කරන භෝග සඳහා ය.







## මහවැලි ද්‍රෝණියේ ජල සම්පාදනය හා දිළිඳුබව කෙරෙහි දේශගුණ විපර්යාසයන්හි බලපෑම

මහවැලි ගංගා ද්‍රෝණියේ විශාල ප්‍රදේශයකට ජලය ලැබෙනුයේ මහවැලි අධිකාරිය මගින් පාලනය කරන ජලාශ ජාලයක් හා එමගින් පෝෂණය වන ඇළ මාර්ග වලිනි. එමගින්, ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශයන්හි දේශගුණය ආශ්‍රිත වර්ෂාපතන විචල්‍යතාවයෙහි බලපෑම අවම වී ඇත. විශාල ජලාශයන් හා වාරිමාර්ග පද්ධතීන් නිසා සුදුසු කාලයේදී වාරිමාර්ග ජලය ලැබෙන බැවින් දේශගුණ අවධානම අවම වී ඇත. එහෙත්, සංවර්ධනයේ ප්‍රතිලාභ තවමත් නොලැබූ තවත් ප්‍රදේශයන් මෙම ගංගා ද්‍රෝණියේ ඇත. වර්ෂා ජලයෙන් හා සුළු වාරිමාර්ග වලින් පමණක් වගා කරන බොහෝ ප්‍රදේශයන් මෙම ගංගා ද්‍රෝණිය තුල ඇත. එසේම එම ප්‍රදේශ නියං, ගංවතුර හා නායයාම් වැනි ස්වාභාවික ආපදාවන්ට නිරතුරුවම නිරාවරණය වෙමින් පවතී. මෝසම් වර්ෂාවත් සමග මෙම ප්‍රදේශයන්හි ජීවත් වන ගොවි ජනතාව ගොවිතැන් කටයුතු සිදු කරයි. සහතික කරන ලද ජල සම්පාදනයක් නොමැති වැසි ජලය මත පමණක් රැඳී සිටින ගොවීන් අතර දිළිඳුබව හා ආහාර අනාරක්ෂිතභාවය ඉතා ඉහළය. සුදුසු වෙලාවට ප්‍රමාණවත් අයුරින් ජලය නොලැබීම හේතුවෙන් මෙම ගොවීන්ගේ අස්වැන්න ඉතා පහත අගයක පවතී. එසේම ඔවුන් වෙළඳපොළ වටිනාකම අඩු භෝග වගා කරයි. මෙහි ජීවත්වන ගොවීන් එක කන්නයක් පමණක් වගා කරයි. අනිත් කන්නයේදී ඔවුන්ගේ ජීවනෝපායේ අනාරක්ෂිතභාවය ඉහළය. එසේම එම අස්වැන්නෙන් වැඩි කොටසක් පරිභෝජනය කරන්නේ ඔවුන් විසින්මය. එම නිසා ඔවුන්ගේ ආදායම අඩුය. බොහෝ විට ඔවුන් මෙම කාලයේදී වෙනත් ජීවිකාවන් සොයා ප්‍රදේශයෙන් පිටවී යයි. ඔවුන්ට විකල්ප ජීවනෝපායන් තම ප්‍රදේශයේම සිදු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් නොමැති වීම මෙයට බලපා ඇත. වර්ෂා ජලයෙන් හා සුළු වාරිමාර්ග වලින් වගා කරන මෙම ප්‍රදේශ තුළ ආපදාවන් සිදුවීම හා ජීවනෝපාය අනාරක්ෂිතභාවය ඉතා ඉහළය.

මහවැලි ගංගා ද්‍රෝණියේ ජීවත් වන බොහෝ පිරිසක් උෂ්ණත්වය ඉහළයාම හා වර්ෂාපතන විචල්‍යතාවයන් වැනි දේශගුණ විපර්යාස ආශ්‍රිත බලපෑම් වලට පොදුවේ මුහුණ දෙයි. මේනිසා ඔවුන්ගේ ජීවනෝපාය අනාරක්ෂිත තත්ත්වයක් පෙන්නුම් කරයි. දේශගුණ විපර්යාස වලට අනුහුරුවීමේ හැකියාව අඩු වීම සහ ඔවුන්ගේ ජීවනෝපාය ක්‍රම දේශගුණික සාධක මත දැඩිව බැඳී පැවතීම මේ සඳහා හේතු වී ඇත. එසේම මහවැලි ගංගා ද්‍රෝණියේ ජීවත් වන ජනතාව දේශගුණ විපර්යාස නිසා විවිධ ආපදාවන්ට මුහුණ පා ඇත.

1. එක් දිනකට ලැබෙන දැඩි වර්ෂාපතන හේතුවෙන් නායයෑම් අවදානම ඉහළ ගොස් ඇත.
2. වියලි කාලයන්ගෙන් පසුව ඇතිවන අසාමාන්‍ය වර්ෂාපතන තත්ත්වයන් ඉහළ යාම හේතුවෙන් මහවැලි ප්‍රදේශයේ සෝදාපාළුව සහ භූමි හායනය සිදුවන ප්‍රමාණය හා තීව්‍රතාවය ඉහළ ගොස් ඇත.
3. මෝසම් වර්ෂාපතනය ඉහළ යාම නිසා හදිසි ගං වතුර තත්ත්වයන් ඇතිවීම.
4. උෂ්ණත්වය ඉහළ යාම හා වර්ෂාපතනය අඩු වීම නිසා දිගු කාලීන නියං තත්ත්වයන් ඇතිවීම.

මෙසේ බලන කළ මහවැලි ගංගා ද්‍රෝණියේ ජීවත්වන ගොවි ජනතාව විවිධ දේශගුණ විපර්යාස වලින් පීඩාවිඳින බව පැහැදිලිය. මෙම තත්ත්වය අවම කිරීමට පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හා ලෝක ආහාර වැඩසටහන සමඟ එක්ව මහවැලි ගංගා ද්‍රෝණි ආශ්‍රිත ගොවිජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරුකරවීමේ ව්‍යාපෘතියක් මැදිරිගිරිය, ලංකාපුර හා වලපනේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක කරමින්

පවතී. මූලික වශයෙන් මෙම ව්‍යාපෘතිය මගින් එම ප්‍රදේශවල ජීවත් වන ජනතාව දේශගුණ විපර්යාස වලට අනුහුරුකරවීමට හා ආහාර සුරක්ෂිතභාවය වැඩි කිරීම මගින් ඔවුන්ගේ ජීවනෝපාය තත්ත්වය උසස් කිරීමට බලාපොරොත්තු වේ.

මෙලෙස විවිධ ව්‍යාපෘති වැඩසටහන්, වැඩමුළු හා දැනුවත් කිරීම් සිදුකිරීම මගින් මහවැලි ගංගා ද්‍රෝණිය තුළ ජීවත් වන ජනතාව දේශගුණ විපර්යාස වලට අනුහුරු කරවීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීම කාලෝචිතය.

(පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණි ආශ්‍රිත ගොවි ජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘති වාර්තාව සහ මහවැලි අධිකාරි වෙබ් පිටුව ඇසුරිනි.)